**පරන්තන් කෙමිකල්ස් සමාගම - 2024**
**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පරන්තන් කෙමිකල්ස් සමාගමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 09 වන ඡේදය ප්‍රකාරව තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට අගය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයේ දියර ක්ලෝරීන් තොගය ශුද්ධ උපලබ්ධි අගය ලබාගැනීමෙන් තොරව පිරිවැයට දක්වා තිබුණු අතර කෝස්ටික්සෝඩා තොගය, පිරිවැය සැලකිල්ලට ගැනීමෙන් තොරව ශුද්ධ උපලබ්ධි අගයට දක්වා තිබුණි. ඒ හේතුවෙන් අවසන් තොගය හා ලාභය රු.946,272 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ගණනය කර ඉදිරිපත් කර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට අගය කළ යුතුය. |
| (ආ) | දේපල පිරියත හා උපකරණ පිලිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂිත තත්ත්වයන් ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද, 2024 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු.167,008,552 ක් වූ සමාගමේ වත්කම් වර්ග 11 කට අදාළ අයිතම 3,851 ක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය එසේ සමාලෝචනය කර නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තුමේන්තුවට භාර දී ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂිත තත්ත්වයන් ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතයට ගනු ලබන පිරිවැය එකතුව රු.239,531,004 ක් වූ දේපල පිරියත හා උපකරණ වර්ග 06 ක ඒකක 2674 ක ධාරණ අගය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 79 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නිවැරදි කරනු ලැබේ. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතයට ගනු ලබන දේපළ පිරියත හා උපකරණවල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 42 ඡේදය ප්‍රකාරව පෙර කාලපරිච්ඡේද දෝෂ නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයයන් නැවත ප්‍රකාශ කිරීම සිදු කළ යුතු වුවත් එසේ නැවත ප්‍රකාශ නොකර පෙර කාලපරිච්ඡේදයට අයත් එකතුව රු.30,228,323 ක වැරදි 03 ක් ගැලපීම් සිදු කර තිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | පූර්ව කාලපරිච්ඡේද දෝෂ නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයයන් නැවත ප්‍රකාශ කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගණනය කිරීම් දෝෂයක් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක පාරිතෝෂික වියදම සහ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ගිණුමේ ශේෂය රු. 901,512 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.තවද පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ගිණුමේ ආරම්භක ශේෂය ජ'නල් සටහනක් මඟින් රු.1,618,962 ක් හර කර රඳවාගත් ඉපයීම් එම ප්‍රමාණයෙන් බැර කර තිබුණ ද, ඒ පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | නිවැරදි කර ඉදිරිපත් කරනු ලැබේ. | සේවක පාරිතෝෂික වියදම සහ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතු අතර ජ'නල් සටහන්වලට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ විලම්බිත බදු වගකීම රු.57,707,776 ක් වුවද, එය රු.106,979,920 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල බදු වියදම සහ විලම්බිත බදු වගකීම රු 49,272,144 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කර ඉදිරිපත් කරනු ලැබේ. | වර්ෂයට අදාළ විලම්බිත බදු වගකීම ගණනය කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේදී සමාගම විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත නිකුත් කරන ලද 900 kg ක්ලෝරීන් සිලින්ඩර් 856 ක් සඳහා නැව් ගාස්තු ඉහළයාම හේතුවෙන් ඒකකයක් රු.20,000 බැගින් දක්වා තිබූ ඉන්වොයිස් වටිනාකමින්, ඒකකයක් සඳහා රු.13,104 ක් පමණක් ලැබී තිබූ අතර තවදුරටත් ලැබිය යුතු වෙළඳ ණයගැති ශේෂය වූ රු.5,902,976 නොලැබෙන බව තහවුරු වුවද ඒ වෙනුවෙන් හානිකරණ ප්‍රතිපාදනය කර නොතිබුණි. | ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ගෙවීමට එකඟ වී ඇත්තේ රු.13,104 ක් බව අප ආයතනය වෙත ලිඛිතව දන්වා ඇත. මේ සම්බන්ධයෙන් අප ආයතනයේ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර තීරණයක් ලබාගෙන,එම තීරණය විගණන හා කළමණාකරණ කමිටුව වෙත ඉදිරියේ දී ඉදිරිපත් කරනු ලැබේ. | අය කර ගැනීම පිළිබඳ අවිනිශ්චිත ස්වභාවයේ ණයගැති ශේෂ සම්බන්ධයෙන් හානිකරණ ප්‍රතිපාදනය කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.) | වෙනස (රු.) | කළමනාකා රීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ක්ලෝරීන් සිලින්ඩර්වලට අදාළ සමුච්චිත ක්ෂය වටිනාකම | 282,928,278 | 284,110,278 | 1,182,000 | නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම අනුරූපී වාර්තා අනුව වටිනාකම සමඟ සැසඳිය යුතුය. |

**1.5.4 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රු.705,363,700 ක් වූ ක්ලෝරීන් අලෙවි ආදායමින් සියයට 90 ක් එනම්, රු.632,838,000 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට සිදුකරන ලද විකුණුම්වලින් ලැබී තිබුණ ද, එම ආයතනය සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද, එක් ගැණුම්කරුවෙකු මත පමණක් ආයතනය රඳා පැවතීමත්, නව ගැණුම්කරුවන් කෙරෙහි අවධානය යොමු නොකිරීමත් මත අනාගතයේදි ව්‍යාපාරික අවදානමක් පවතින බව විගණනයේදි නිරීක්ෂණය විය. | බාහිර ගැනුම්කරුවන් අපනයන ක්ෂේත්‍රයේ රැඳී සිටින බැවින් දියර ක්ලෝරීන් ආනයනය කර ගැනීමේදී බදු වලින් නිදහස්ව ක්ලෝරීන් ආනයනය කිරීමේ හැකියාව පවතී. එබැවින් ඔවුන් ඉතා අඩු මුදලකට ක්ලෝරීන් ආනයනය කර ගැනීම නිසා පෞද්ගලික ගැණුම්කරුවන් 100% ක්ම අප වෙතින් ක්ලෝරීන් මිලදී ගැනීමට යොමු කර ගැනීම අපහසුව පවතී.<br>ජාතික ජල සම්පාදන මණ්ඩලයේ මුළු ක්ලෝරීන් අවශ්‍යතාවය සැපයීම ආයතනය විසින් සිදුකරනු ලබයි. දැනට පරන්තන්හි කෝස්ටික් සෝඩා/ක්ලෝරීන් රසායනික කර්මාන්ත ශාලාව ස්ථාපිත කිරීමේ මූලික වැඩකටයුතු ආරම්භ කොට ඇත. කර්මාන්තශාලාව ආරම්භයෙන් පසු ජාතික ප්‍රතිපත්තියක් මත ක්ලෝරීන් බෙදා හැරීමට හැකි වනු ඇත. | නව ගැණුම්කරුවන් සොයා ගැනිම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් ඇති කල යුතුය. ගැනුම්කරුවන් සමඟ ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිරිවැයෙන් ඉවත් කර තිබුණු රු.824,200 ක් වූ කන්ටේනර් හා සිලින්ඩර් සම්බන්ධයෙන් සිලින්ඩර් සංඛ්‍යාව, පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම හා ක්ෂය ගණනය කිරීම් ද, රු.4,336,500 ක් වූ වෙළඳ ණයගැති ශේෂ සම්බන්ධයෙන් ලැබෙන බවට තහවුරු කිරීම සඳහා වන සාක්ෂි සහ රු.17,214,000 ක් වූ සිලින්ඩර් තැන්පතු සම්බන්ධයෙන් ලදුපත් යන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | කන්ටේනර් හා සිලින්ඩර් සංඛ්‍යාව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>වෙළඳ ණයගැතියෝ - වාරික වශයෙන් ගෙවා නිමකරන බවට අධිකරණයට දන්වා ඇත.<br>සිලින්ඩර් තැන්පතු - ලදුපත් නිවැරදි කර ඉදිරියේදි ඉදිරිපත් කරනු ලැබේ. | වටිනාකම් තහවුරු කිරීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 05 ක් ඉක්මවූ රු.3,387,445 ක් වූ ණයගැති ශේෂ සමාලෝචිත වර්ෂයේදී ද අය කර ගෙන නොතිබුණි. | නෝත්සී ලිමිටඩ් හා ජාතික කඩදාසි සමාගම සඳහා පියවීමට ඇති මුදල් හැකි ඉක්මනින් පියවීම සඳහා සිහිකැඳවීමේ ලිපි නිකුත් කර ඇත. ජාතික ජල සම්පාදන මණ්ඩලයෙන් අයවිය යුතු රු.1,387,445 ක මුදල ලියාහැරීම සඳහා තවදුරටත් පසු වාර්තා අධ්‍යනය කරමින් තොරතුරු සොයා බැලිය යුතු වේ. | ණයගැති ශේෂ නොපමාව අය කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හදුන්වා දෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2025 ඔක්තෝම්බර් 16 දින එනම් මාස 07 ක් හා දින 18 ක ප්‍රමාදයකින් පසු විගණනයට ඉදිරිපත් කර තිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.311,135,592 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 479,965,403 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.168,829,811 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විකුණුම් ආදායම හා ස්ථාවර තැන්පතු පොලී ආදායම පිළිවෙලින් රු.68,356,759 කින් හා රු.74,146,965 කින් අඩුවීමත් විකුණුම් පිරිවැය සහ පරිපාලන හා ආයතන වියදම් පිළිවෙලින් රු18,577,532 කින් හා රු3,845,212 කින් වැඩිවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍යතාවය පිලිබඳ නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම මත ප්‍රමාණය ඉක්මවා කෝස්ටික් සෝඩා මිලදී ගැනීම හේතුවෙන් 2022 හා 2023 වර්ෂයන්වලදී බංග්ලාදේශයෙන් සහ ඉන්දියාවෙන් මිලදී ගන්නා ලද පිරිවැය රු.57,359,728 ක් වූ කෝස්ටික් සෝඩා 25 Kg ඇසුරුම් 7049 ක් 2023 අගෝස්තු 26, 2025 පෙබරවාරි 14,15,16 හා මාර්තු 22 යන දිනයන් වන විට කල් ඉකුත් වී තිබුණි. ඉන් ඇසුරුම් 1938ක් සමාගමේ නිෂ්පාදන කටයුතු සඳහා | 2022 වර්ෂයේදී බංග්ලාදේශයෙන් ආනයනය කරන ලද තොගයෙන් 2025 සැප්තැම්බර් 02 දින වන විට කෝස්ටික් සෝඩා පතුරු කිලෝ 25 ඇසුරුම් බෑග් 1098 ක් පමණ ඉතිරිව පවතින අතර, එහි ප්‍රමිතිය පරීක්ෂා කිරීමේදී කෝස්ටික් සෝඩා ප්‍රතිශතය යම් ප්‍රමාණයක් පමණක් අඩු වී ඇත. එබැවින් එම කෝස්ටික් සෝඩා පතුරු, කෝස්ටික් සෝඩා දියර සෑදීමේ කාර්යය සඳහා භාවිතා කිරීමට හැක. කෝස්ටික් සෝඩා දියර අලෙවි කිරීම් සඳහා අලෙවි | අවශ්‍යතාවය පිලිබඳ නිවැරදිව ඇස්තමේන්තු කර මිලදී ගැනීම කළ යුතුය. මෙම ඉතිරි තොග උපයෝජනය කළ හැකි විකල්ප ක්‍රම සොයා බලා පාඩුව අවම කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| තබා ගෙන තිබූ අතර, ඇසුරුම් 5111ක් විගණිත දින වූ 2025 නොවැම්බර් වන විට එහි පිරිවැයට වඩා අඩුවෙන් රු.19,180,500කට විකුණා තිබීමෙන් සමාගමට රු.22,213,872ක අලාභයක් සිදුවී තිබුණි. | ප්‍රවර්ධන කටයුතු මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී. 2023 වර්ෂයේදී ඉන්දියාවෙන් ආනයනය කරන ලද කිලෝ ග්‍රෑම් 25 කෝස්ටික් සෝඩා පතුරු බෑග් 408ක් 2025 සැප්තැම්බර් 02 දිනට කළුතර ගබඩාවෙහි ඉතිරිව ඇත. එම බෑග් 408 අපගේ බ්ලීච් දියර නිෂ්පාදනය කිරීම සඳහා තබා ගෙන ඇත. | |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් පුලර්ටන් කර්මාන්තපුරයේ පවත්වාගෙන යනු ලබන පරිශ්‍රයෙහි බදු කුලිය වශයෙන් කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.8,838,720 ක් ගෙවා තිබුණු අතර 2025 අගෝස්තු 17 දින වන විටත් ඊට අදාළව ලිඛිත ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. | ගෙවීමට තිබූ සියලු බදු මුදල් දැනටමත් ගෙවා අවසන් කර ඇත. බදු ඔප්පුව ලබා ගැනිමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු ලිපිලේඛන ප්‍රාදේශීය ලේකම් ,කළුතර වෙත භාර දී ඇත. | බදු කුලිය සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2025 ජුලි 24 දින වන විට සමාගම විසින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ක්ලෝරීන් සැපයීම වෙනුවෙන්, ඒකකයක මිල රු.64,000 සිට රු.260,000ක් වටිනා සිලින්ඩර් 1456 ක් යොදවා තිබුණු අතර නිකුත් කරනු ලබන ක්ලෝරීන් සිලින්ඩර් සඳහා තැන්පත් මුදලක් අය නොකිරිම හේතුවෙන් එම සිලින්ඩර් වලට සිදුවන හානි පූරණය කර ගැනීමට නොහැකිවීමේ අවදානමක් පැවතුණි. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය රජයට අයත් ජනතාවට සේවා සපයන ආයතනයකි. එම හේතුවෙන්ම ආරම්භයේ සිට (වසර 30කට අධික කාලයක් තිස්සේ) එම ආයතනයෙන් සිලින්ඩර් ගාස්තු ලබා ගැනීමට කටයුතු කර නොමැත. එසේම ජාතික ජල සම්පාදන මණ්ඩලයට ඔවුන් සතු 900Kg සිලින්ඩර 126ක් පමණ ඇති අතර පරන්තන් සමාගමේ අඛණ්ඩ සහ ප්‍රධානතම ගැනුම්කරුවා වේ. | සැපයුම්කරුවන් වෙත නිකුත් කරනු ලබන ක්ලෝරීන් සිලින්ඩර් සඳහා තැන්පත් මුදලක් අය කර ගැනීම තුළින් ඇති විය හැකි හානිය පූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉන්දියාවෙන් හා බංගලාදේශයෙන් ආනයනය කර පානීය ජලය පිරිසිදු කිරීම සඳහා යොදාගන්නා ක්ලෝරීන්හි අඩංගු සංයුතිය හා ගුණත්වය සම්බන්ධයෙන් එම ආයතන මඟින් ලබාදෙන සහතිකය සමාගම විසින් පිළිගන්නා අතර එහි අඩංගු සංයුතිය මිනිස් පරිභෝජනයට සුදුසු වන බවට හා සහතිකයේ දක්වා ඇති සංයුතීන් ක්ලෝරීන් තුළ අන්තර්ගත වන බව තහවුරු කර ගැනිම සඳහා ස්වාධීන පරීක්ෂා කිරීමක් සිදු කර නොතිබුණි. | දියර ක්ලෝරීන් වල ගුණත්වය මැනීමට ශ්‍රී ලංකාව තුල කිසිදු ආයතනයක පහසුකම් නොමැති අතර නිෂ්පාදනය කරන අවස්ථාවේදි සැපයුම්කරුගේ පරික්ෂනාගාරය තුළින් නිකුත් කරනු ලබන රසායනාගාර වාර්තාව මත පදනම්ව කටයුතු කීරීම සිදු කරනු ඇත. එහෙත් එය ප්‍රමානවත් නොවිම යන කාරණාවට විසඳුම් වශයෙන් දියර ක්ලෝරීන් වෙනුවෙන් තුන්වෙනි පාර්ශවයක් විසින් නිකුත් කරනු ලබන තත්ත්ව සහතිකයක් ඉදිරිපත් කරන ලෙසත් එය ප්‍රසම්පාදන ලියවිලි තුළ කොන්දේසියක් ලෙස අඩංගු කර ඇත. | ජලය පිරිසිදු කිරීම සඳහා යොදාගන්නා ක්ලෝරීන්හි අඩංගු සංයුතිය හා ගුණත්වය මිනිස් පරිභෝජනයට සුදුසු වන බව තහවුරු කර ගැනිම සඳහා ස්වාධීන පරීක්ෂා කිරීමක් සිදු කළ යුතුය. |